# මොරටුව විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## විශ්වවිද්‍යාල ප්‍රවේශය - අධ්‍යයන වර්ෂය 2025/2026

## මොරටුව විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණ සඳහා අයදුම්පත් කැඳවීම

**(i) වාස්තු විද්‍යාවේදී උපාධි පාඨමාලාව**

**(ii) නිර්මාණවේදී උපාධි පාඨමාලාව**

**(iii) භූමි නිර්මාණවේදී උපාධි පාඨමාලාව**

**(iv) විලාසිතා නිර්මාණය හා නිපැයුම් ප්‍රවර්ධනය උපාධි පාඨමාලාව**

ඉහත සඳහන් පාඨමාලා හතරට (04) අදාළ යෝග්‍යතා පරීක්ෂණවලට පෙනී සිටීම සඳහා අපේක්ෂා කරන අයදුම්කරුවන් ඒ ඒ පාඨමාලා යටතේ 2025/2026 අධ්‍යයන වර්ෂය සඳහා වන විශ්වවිද්‍යාල ප්‍රවේශ අත්පොතෙහි සඳහන් සුදුසුකම් සපුරාලීම අනිවාර්ය වේ. අයදුම්කරුවන් විසින් මොරටුව විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවිය වන http://www.uom.lk හි ඇතුළත් අදාළ අයදුම්පත්‍රය මාර්ගගතව (Online) සම්පූර්ණ කළ යුතුය.

අදාළ අයදුම්කරුවන්ට විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවිය (http://www.uom.lk) තුළට පිවිස ඉහත පාඨමාලාවල යෝග්‍යතා පරීක්ෂණ සඳහා අයදුම් කිරීමට සපුරාලිය යුතු අවම සුදුසුකම් පිළිබඳ වැඩිදුර තොරතුරු ලබාගත හැකිය.

මාර්ගගතව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය අදාළ ලියකියවිලි සමඟ (Online Application) **2026 මැයි මස 06 වන දින ප.ව. 6.00 ට පෙර මාර්ගගතව (Online) ඉදිරිපත් කළ යුතුය.** මෙම දිනයට පසුව ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

වැඩිදුර විමසීම් සඳහා admissions@uom.lk විද්‍යුත් තැපැල් ලිපිනය භාවිතා කරන්න.

විවිධ හේතූන් මත ප්‍රතිඵල නිකුත් නොකරන ලද සිසුන් හා යෝග්‍යතා පරීක්ෂණය සඳහා අවශ්‍ය මූලික අවම සුදුසුකම් වන (S සාමාර්ථ 3) සපුරා නොමැති නමුත්, අ.පො.ස (උසස් පෙළ) 2025 විභාග ප්‍රතිඵල නැවත පරීක්ෂා කිරීම සඳහා දැනටමත් ඉල්ලුම් කර ඇති සහ යෝග්‍යතා පරීක්ෂණය සඳහා අයදුම් කිරීමට බලාපොරොත්තුවන සිසුන්, කරුණාකර "admissions@uom.lk" විද්‍යුත් තැපැල වෙත විද්‍යුත් පණිවුඩයක් යොමු කරන්න.

**ලේඛකාධිකාරී,**
**මොරටුව විශ්වවිද්‍යාලය,**
**කටුබැද්ද, මොරටුව.**
2026.04.07